**සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල - 2016**

**-------------------------------------------------------**

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව විස්තරය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී.

ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

**--------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස ආදායම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංග වලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය ව්‍යාචනය

----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රමිත අංක 1 හි ඡේද අංක 21 ක ප්‍රකාරව අරමුදලේ ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබූ අතර අනුගමනය කරන ලද වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ප්‍රමිත අංක 2 හි ඡේද අංක 21 (අ) ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර නොතිබුණි.

(ඇ) ප්‍රමිත අංක 7 ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සමඟ ඉදිරිපත් කරනු ලබන දේපල පිරියත හා උපකරණ උපලේඛනයේ සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු. 3,480,981 ක් වූ පරිගණක හා උපාංග වර්ෂයේ මිලදී ගැනීම් ලෙස වෙනම හෙළිදරව් කලයුතු වුවද ඊට පටහැනිව ආරම්භක ශේෂයට ඇතුළත් කර දක්වා තිබූ අතර, රු. 6,003,155 ක් වූ පොතුවිල් සංචාරක නිවාසයේ නීත්‍යානුකූල අයිතිය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු බව ගිණුම්කරණ සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශේෂ ව්‍යාපෘති 5 කට අදාළව දරන ලද එකතුව රු. 5,222,780 ක් වූ වියදම් පරිපාලන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළව, වියදම් ශීර්ෂ 7 ක් වෙනුවෙන් 2017 වර්ෂයේදී ගෙවා තිබූ එකතුව රු. 327,119,813 ක් වූ වියදම් සම්බන්ධයෙන් අවශ්‍ය වෙන්කිරීම් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ රු. 797,868 ක් වූ දේපල පිරියත හා උපකරණ ක්ෂය ආදායම් වියදම් ගිණුමට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාල උපකරණ ශුද්ධ ශේෂය ආරම්භක ශේෂය ලෙස ගැනීමේදි රු. 23,606 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ නිලාවේලි පුහුණු මධ්‍යස්ථානයේ අළුත්වැඩියා සඳහා රු. 2,177,326 ක අත්තිකාරම් ගෙවීම, අත්තිකාරම් ලෙස ගිණුම් ගතකර නොතිබූ අතර එම මුදල වැය දැරීමකින් තොරව දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් පියවීම ගිණුම්ගත කිරීමේදී මුදල් ලැබීම පමණක් නිවැරදිව ගලපා තිබුණද අත්තිකාරම් ගිණුමට අදාල පියවීම් සටහන සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

**2.2.3 නොසැසඳෙන පාලන ගිණුම්**

ගිණුම සමඟ ඉදිරිපත් කර තිබූ පාලන ගිණුම පරීක්ෂා කිරීමේදී දිස්ත්‍රික්ක 12 ක ප්‍රතිලාභි ගෙවීම් හා දිස්ත්‍රික්ක 11 ක ප්‍රතිලාභි ලැබීම් පාලන ගිණුම් වලට අදාලව මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර වෙනස රු. 1,202,823 ක් නිරීක්ෂණය විය. තවද, වියදම් වර්ග 2 ක මුදල් පොත අනුව හා ආදායම් වියදම් ගිණුම අනුව රු. 212,884 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ගිණුම් විෂයයන් 5 කට අදාළව එකතුව රු. 19,184,984 ක ගනුදෙනු සම්න්ධයෙන් ගෙවීම් සනාථ කිරීමට බිල්පත් සහ උපලේඛන යන විගණන සාක්ෂි ඉදිරිපත් නොවුණි.

**2.2.5 ඉකුත් වර්ෂ සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය**

1997 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම අරමුදල 1997 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමකින් තොරව, 2016 පෙබරවාරි 10 දින රැස්වූ භාරකාර මණ්ඩලය විසින් අරමුදලේ 2013, 2014 සහ 2015 වර්ෂවල ගිණුම් විගණනය කිරිම සඳහා පෞද්ගලික විගණකවරයෙකුගේ සහාය ලබාගෙන රු. 11,760,000 ක් ගෙවා තිබුණි. එසේම පෞද්ගලික විගණක විසින් එම වර්ෂ 3 සඳහාම මතය ව්‍යාවනය කර විගණන වාර්තා ඉදිරිපත්කර තිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේ සිට පැවත එන වැඩිපුර ලැබුණු රක්ෂණ වාරික මුදල රු. 968,262 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 4 ක 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පැවත එන රු. 5,163,240 ක් වූ නොපියවූ අත්තිකාරම් ශේෂ වර්ෂ 2 ක සිට වර්ෂ 4 ක් දක්වා කාලයක් ඉක්මවා තිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක් වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ)** | 2006 ජනවාරි මස 26 දිනැති 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2.1 “අ” හා “ආ” මාර්ගෝපදේශ | අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු. 201,646,781 ක වත්කම් හා දේපල මිලදී ගැනීම් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 15 ඡේදය | අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර අරමුදල සම්බන්ධයෙන් වාර්ෂික කාර්යසාධන වාර්තාවක් පිළියෙල කිරීමටද කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර වත්කම්වල නිවැරදිතාවය සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 1,121,745,567 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 450,734,305 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 671,011,262 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට දායක මුදල් ලැබීම් රු. 915,125,650 කින්ද ආයෝජන පොලී ආදායම රු. 302,632,484 කින්ද ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**4.1 කාර්යසාධනය**

------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1997 ජනවාරි 01 දින ප්‍රකාශයට පත්කරන ලද සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලට අදාල භාර ඔප්පුව ප්‍රකාරව සමෘද්ධි ප්‍රතිලාභින්ගේ සුභසාධනය හරහා සමාජ සංවර්ධනය ඇති කිරීමට අවශ්‍ය වියදම් හා පහසුකම් සැපයීමේ පරමාර්ථ හා අරමුණු ඇතිව මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද, අරමුදලේ පරමාර්ථ හා අරමුණු වලින් බැහැරව සමාලෝචිත වර්ෂයේදී රු. 93,741,659 ක් වැය කර තිබුණි.

(ආ) ශිෂ්‍යභට කණ්ඩායම්වලට ඇතුළත් අඩු ආදායම් හා සමෘද්ධිලාභී දරුවන්ට "හර්මන් ලෝස්" තරගාවලියට සහභාගිවීම සඳහා පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියට සමාලෝචිත වර්ෂයේදී ලබාදුන් රු. 1,947,060 ක මුදලින් රු. 965,461 ක් වියදම් දැරීමකින් තොරව මාස 9 කට අධික කාලයක් ජංගම ගිණුමේ රඳවා ගෙන තිබුණි. තවද, රු. 221,600 කට මිලදී ගෙන තිබූ රයිෆල් 2 ක් භෞතික පරීක්ෂාවට ඉදිරිපත් නොකළ අතර, ඉන්වෙන්ට්‍රි ලේඛනයක් ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) අරමුදලේ අරමුණුවලට අදාළ නොවන වැඩිහිටි නිවාසවල සාමාජිකයන්ට වන්දනා චාරිකා යාම සඳහා 2016 වර්ෂයේදි එක් බස්රථයක වටිනාකමරු.7,990,000 ක් බැගින් බස්රථ 9 ක් සඳහා රු. 71,910,000 ක් වැයකර තිබූ අතර එම බස්රථ මිලදී ගත් ආයතනය වෙතින් 2017 වර්ෂයේදි විගණන අවශ්‍යතා සඳහා ලබාගත් මිල කියුම අනුව බස්රථයක වටිනාකම රු.

6,500,000 වුයෙන් මිල ගණන් සැසදීමේදී එක් බස්රථයක් වෙනුවෙන් රු. 1,490,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව බස්රථ පරීක්ෂා කිරීම සඳහා නිලධාරින් 4 දෙනෙකු දින 3 ක ඉන්දීය සංචාරයක් සිදුකර තිබූ අතර ඒ සඳහා රු. 134,075 ක අනියම් දීමනාවක් ගෙවා තිබුණි. මෙම බස්රථවල ලියාපදිංචි අයිතිය හා පාලනය පළාත් පාලන ආයතනවලට පවරා තිබුණි.

(ඈ) සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන්වලට අදාළව 2014/2016 සහ 2015/2017 යන අධ්‍යයන වර්ෂවල ශිෂ්‍යත්ව පිරිනැමීමේ උත්සවය සඳහා රු. 6,728,074 ක වැය කර විෂයභාර අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් උත්සවයක් පවත්වා තිබියදීත්, තවත් දිස්ත්‍රික්ක 03 ක උත්සව පවත්වා ශිෂ්‍යත්ව ප්‍රදානය වෙනුවෙන් රු.41,681 ක්ද වශයෙන් එකතුව රු. 6,796,755 ක උත්සව වියදමක් දරා තිබුණි.

(ඉ) සමෘද්ධි සහනාධාරලාභී පවුල්වල උසස් පෙළ හදාරණ දරුවන්ට මූල්‍ය සහනයක් ලබාදීම සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් ආරම්භ කර තිබුණද 2014/2016 අධ්‍යයන වර්ෂයේ උසස් පෙළ හදාරන ශිෂ්‍යත්වලාභීන් 9,687 ක් වෙනුවෙන් රු. 154,992,000 ක් මාස 16 ක කාල ප්‍රමාදයකින් හා තවද, 2015/2017 සහ 2016/2018 අධ්‍යයන වර්ෂ සඳහා ශිෂ්‍යයන් 19,313 ක් වෙනුවෙන් රු. 289,709,000 ක් මාස 16 ක සිට මාස 04 ක කාල ප්‍රමාදයකින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යවා තිබුණි. එම හේතුවෙන් අවශ්‍ය කාල සීමාව තුළ අදාළ දරුවන්ට ශිෂ්‍යාධාර නොලැබී තිබුණි.

(ඊ) තෝරාගත් සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 50 දෙනෙකුට සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව 2016/2017 හැදෑරීම සඳහා රු. 4,165,000 ක් ජාතික සමාජ සංවර්ධන ආයතනයට ගෙවා තිබුණි. පාඨමාලාවට සහභාගි වූ අය පිළිබඳ 2021 නොවැම්බර් 5 දින ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් ඉදිරිපත් කරන ලද නාම ලේඛනය අනුව සිසුන් 20 ක් පාඨමාලාව හදාරා නොමැති බව නිරීක්ෂණය වූයෙන් ඒ සඳහා වැය කරන ලද රු. 1,666,000 ක මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.

(උ) නිලාවෙළි පුහුණු මධ්‍යස්ථානය මිලදී ගැනීම සඳහා 2016 මැයි මාසයේදී නැගෙනහිර ප්‍රාදේශීය ප්‍රධාන තක්සේරුකරු විසින් රු. මිලියන 126 කට දළ තක්සේරුවක් කර අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර තිබූ අතර, නැවත වතාවක් 2016 සැප්තැම්බර් මාසයේදී නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු විසින් රු.මිලියන 113 ක තක්සේරුවක් ඉදිරිපත් කර තිබුණි. විකුණුම්කරු විසින් මෙම තක්සේරු වාර්තාව සම්බන්ධව ඉදිරිපත් කර ඇති අභියාචනය සලකා බලා 2016 සැප්තැම්බර් මාසයේදී මෙම වටිනාකම රු. මිලියන 121 කට තක්සේරු කිරීම හේතුවෙන් මධ්‍යස්ථානය සඳහා අවස්ථා 03 කදී විවිධ තක්සේරු වටිනාකම් ඉදිරිපත් කිරීම මතභේදයට තුඩුදෙන කරුණක් විය.

## 4.2 ආයෝජන කළමනාකරණය

-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 ජනවාරි මාසයේදී ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වසරක කාලයක් සඳහා ආයෝජනය කර තිබූ ස්ථාවර තැන්පතු 6 කින් ස්ථාවර තැන්පතු 5 ක් සඳහා පොලී ප්‍රතිශතය සියයට 6.6 ක් වූ අතර රු. 500,000,000 ක් වූ තැන්පතුව සඳහා පොලී ප්‍රතිශතය සියයට 6.5 ක් වීම හේතුවෙන් වර්ෂය සඳහා අහිමි වූ පොලිය රු. 500,000 ක් විය.

(ආ) ස්ථාවර තැන්පතුවල ආයොජනය කිරීමේදී රාජ්‍ය බැංකුවල පවතින පොලී අනුපාත පිළිබඳ අවධානය යොමුකර අදාළ දිනට උපරිම පොලී අනුපාතයක් ලබාදෙන බැංකුවක ආයෝජනය

කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොමැති අවස්ථා 5 ක් නිරීක්ෂණය වූ අතර එමගින් අහිමි වූ පොලිය රු. 1,165,874 ක් විය.

(ඇ) ලංකා බැංකුවේ ඇති රු. 46,119,618 ක් වූ ස්ථාවර තැන්පතු ආයෝජනයක් කල්පිරීමෙන් පසු 2016 ජූලි මාසයේ සිට මාස 6 කට ප්‍රති ආයෝජනය කර තිබූ අතර එම ආයෝජනය කල්පිරීමට පෙර ඔක්තෝබර් මාසයේදී උපලබ්ධි කර ගැනීම හේතුවෙන් සාමාන්‍ය ඉතුරුම් පොළියක් හෝ ලැබී නොතිබුණි.

4.3 **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

අරමුදල සඳහා ගණකාධිකාරිවරයෙකු ස්ථිරව බඳවා ගැනීමට කටයුතු නොකර 2012 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වාම අවස්ථා 4 කදී වැඩ බැලීම හා කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාම ගිය නිලධාරීන් හා වෙනත් ආයතනවල නිලධාරීන්ගේ සේවය ලබාගෙන තිබුණ ද අරමුදලේ මූල්‍ය ප්‍රකාශන නියමිත කාල පරිච්ඡේදය තුළ ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

--------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(2)(ඇ) ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් තුළ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසර 05 ක ප්‍රමාදයකින් පසුව 2021 ජූලි 14 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

-----------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් විගණනයක් සිදුකර නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

------------------------------

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1) රෙගුලාසිය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර ගිණුම් පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.